ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව** |
|---|---|
| දිනය | **2013 සැප්තැම්බර් 09 වැනි දින** |

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද්‍රවශීලතා ගැටළුවලට මුහුණ දෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා මූල්‍ය ආධාර වැඩසටහනක් හඳුන්වා දීම**

මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය නංවාලීම සඳහා ද්‍රවශීලතා ගැටළුවලට මුහුණ දෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ද්‍රවශීලතා ආධාරක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කර ඇත. මෙම වැඩසටහන මගින් එම මුදල් සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමට සහ ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමට ආධාර කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල එක් එක් මුදල් සමාගමේ ද්‍රවශීලතා තත්වය අධ්‍යයනය කිරීමෙන් පසුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල යටතේ ද්‍රවශීලතා ආධාර ලබාදීම මෙමගින් සිදු කෙරේ.

මෙම ද්‍රවශිලතා ආධාර වැඩසටහනට සමගාමීව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල මුදල් සමාගමේ දැනට සිටින කොටස් හිමිකරුවන්ට එම මුදල් සමාගමට නව ප්‍රාග්ධනය ලබාදීමට හෝ උපායමාර්ගික ආයෝජකයෙකු මගින් අදාල මුදල් සමාගමේ කොටස් සඳහා අලුතින් ප්‍රාග්ධන ආයෝජනයක් සිදු කිරීමට හෝ අවශ්‍ය වන අවස්ථාවලදී එම මුදල් සමාගමේ තැන්පත්කරුවන්ටද ඔවුන්ගේ තැන්පතුවල කොටසක් මුදල් සමාගමේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමට හෝ විධාන කල හැකිය.

ද්‍රවශීලතා ආධාර වැඩසටහන යටතේ ආධාර බලාපොරොත්තු වන මුදල් සමාගමක් ඒ සඳහා පිළිගත හැකි ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කල යුතු අතර, අනුබද්ධිත සමාගම්වලට ණය ලබාදීම වැනි සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදු කරන ගණුදෙනුවල සීමා කිරීම්, අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ වැටුප් හා අනෙකුත් දීමනාවල සීමා කිරීම්, පරිපාලන වියදම් අඩු කිරීම්, පිළිගත හැකි ඇපකරයන් ලබාදීම සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මේ ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කිරීම යනාදි කොන්දේසි සහ නියමයන්ද සැපිරිය යුතු වේ.

ඉහත සඳහන් ද්‍රවශීලතා ආධාර වැඩසටහන වහාම ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසා ඇත.